GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

**23/07/2014**

**මාධ්‍ය නිවේදනය**

වෛද්‍ය රංජනී ගමගේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට අපහාස වන අයුරින් සිදුකල මාධ්‍ය ප්‍රකාශය සම්බන්ධව නීති මගින් කටයුතු කිරීමට අප සංගමය තීරණය කර ඇත.

අප සංගමයේ භාරකරුවන් කටයුතු කළ යුත්තේ මධ්‍යම කාරක සභාවේ තීරණ වලට අනුව මිස අත්තනෝමතිකව නොවන බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව මධ්‍යම කාරක සභාව ඒකමතිකව තීරණය කර ඇත්තේ සංගමයට අපහාස කළ සියළුදෙනාට විරුද්ධව විනයානුකූල පියවර ගැනීමයි.

වෛද්‍ය රංජනී ගමගේ රජයේ තනතුරු කිහිපයක් දරන නිසා ඇයගේ අපහාසාත්මක ප්‍රකාශය රජයේ ස්ථාවරය ලෙස වැරදි චිත්‍රයක් හුවා දැක්වීමට ඉඩ ඇත. රජය මානව හිමිකම් චෝදනා වලට ලක් වූ අවස්ථාවක ප්‍රබල වෘත්තීය සමිතිවල ප්‍රජාතන්ත්‍රවාදී තීරණ වලට රජයේ බලපෑම් එල්ල කරන බවට චෝදනා ලැබීමට මෙම වෛද්‍යවරියගේ හැසිරීම හේතු විය හැක. එපමණක් නොව ඇයගේ වගකීමකින් තොර අපහාසාත්මක ප්‍රකාශ නිසා ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණ වලදී ද රජයට අවාසිදායක වීමට හේතු වනු ඇත. එම නිසා සමාජිකත්වයෙන් 95% ඉක්මවූ අතිබහුතරය වෙනුවෙන් අප අතිගරු ජනාධිපතිතුමන්ගෙන් ඉල්ලා සිටින්නේ මෙම වෛද්‍යවරියගේ වගකීමකින් තොර ක්‍රියාකලාපය පිළිබඳ විනායානුකූලව කටයුතු කරන ලෙසයි.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට විරුද්ධව, සද්භාවයෙන් තොරව, කුමණ්ත්‍රණකාරී සහ ද්වේශසහගත ලෙස වෛද්‍යවරු සුළු පිරිසක් ක්‍රියා කරන බවට කොළඹ දිසා අධිකරණය 114/13 නඩු තීන්දුව මගින් ප්‍රකාශයට පත් කර ඇත. අප මීට පෙර පැවසුවේද සත්‍යය කවදා හෝ ජයගන්නා බවයි.

අප සංගමයේ ව්‍යවස්ථාව අනුව සංගමය විනාශ කරන්නන් ලෙස තීන්දු වූ සමාජිකයින්ගේ සමාජිකත්වය අහෝසි කළ හැක. මේ අනුව සංගමය තුළ රැඳී සිටිමින් සංගමයට හානි කරන මෙම වෛද්‍යවරු කිහිප දෙනාට එසේ කිරීමට හැකි අවසන් කඩාකප්පල් ක්‍රියාව මෙය වනු ඇත. මේ අනුව මෙම පිරිසට මින් ඉදිරියේදී සංගමයේ සමාජිකයින් ලෙස පෙනී සිටිමින්, සංගමයේ විනාශය වෙනුවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව සම්පූර්ණයෙන්ම අහෝසි වී යනු ඇත.

ස්තුතියි

Epitakadu

වෛද්‍ය චන්දික එපිටකඩුව
මාධ්‍ය අනුකමිටුව

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර | වෛද්‍ය චන්දික එපිටකඩුව | 0718609961 |
| | වෛද්‍ය ප්‍රසාද් රණවීර | 0773527476 |
| | වෛද්‍ය විපුල ඉන්ද්‍රලාල් | 0717368142 |
| | වෛද්‍ය හරිත අලුත්ගේ | 0718121619 |
| | වෛද්‍ය අමිල මදුරාගොඩ | 0773553186 |